www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ්ගේ මැද පෙරදිග සංචාරය එක්සත් ජනපද ප්‍රතිපත්තියේ අර්බුදය එලි දක්වයි

## Bush Middle East trip highlights crisis of US policy

**ඇලෙක්ස් ලැන්ටියර් විසිනි**
**2008 මැයි 15**

ජනාධිපති ජෝර්ජ් බුෂ් සවුදි අරාබිය හා ඊජිප්තුවට ද යාමට නියමිත ඔහුගේ පස් දින මැද පෙරදිග සංචාරයේ පලමු පියවර ලෙස 14 වන දින ඊස්රායලය වෙත ලඟාවිය. ප්‍රසිද්ධ ප්‍රකාශයන්හිදී බුෂ් සිත් ගන්නා සුලු කථාවට සීමාවීමට උත්සාහ කල ද ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑමට හා වොෂින්ටනයේ සමස්ත පිලිවෙත මගින් කලාපය වඩ වඩාත් අස්ථාවරත්වයට පත්වීම හමුවේ ඒවා පවා නොහික්මුනු තර්ජනයක විලාසයක් ගත්තේය.

පලස්තීනුවන් අතර "ව්‍යසනය" ලෙස ප්‍රකට ඊස්රායල් රාජ්‍යය නිර්මානය කිරීමේ 60 වන සංවත්සරය යෙදී ඇති දිනයේ උත්සව මධ්‍යයේ බුෂ් ටෙල් අවිව් වෙත ලඟාවිය. අගමැති ඒහුඩ් ඔල්මර්ට්ගේ ආන්ඩුව ඊස්රායලයේ උත්සව පැවැත්වෙන දෙදින තුල ඊස්රායල්-පලස්තීන දේශසීමා වසාදැමූ අතර දේශසීමා මුරපොලවල් ගනනාවක් අසල විරෝධතාවයේ යෙදුනු පලස්තීනුවන්ට ඊස්රායල් හමුදා කඳුලුගෑස් ප්‍රහාර එල්ල කලේය.

ඊශස්රායලයට දෙන එක්සත් ජනපද සහාය යලි සහතික කිරීමෙන් පසුව බුෂ් "ඊස්රායලය තුල ප්‍රජාතන්ත්‍රවාදයේ 60 වසර" ප්‍රශංසාවට ලක්කරමින් " මෙහි සිදුවූ දෙය සෑම තැනකම සිදුවිය හැකි" යයි කියා සිටියේය. පලස්තීනුවන්ට එරෙහිව කෙරීගෙන යන මර්දනයත් ඉරාකයේ හා ඇෆ්ගනිස්තානයේ එක්සත් ජනපදය මූලිකත්වය ගත් ලේ වැකි වාඩිලෑමත් දෙස බලාසිටින ලොව පුරා මිලියන ගනනක් ජනතාවට බුෂ්ගේ කතා ඇසෙන්නේ නිසැකව ම පොරෙන්දුවකට වඩා තර්ජනයක් ලෙස ය.

ඊස්රායල ජනාධිපති සිමොන් පෙරේස් හා අගමැති ඔල්මර්ට් සමඟ සැඳෑ සාදයකට එක්වූ බුෂ් දිගු කථාවක් කලේය. විය යුතු පරිද්දෙන්ම "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" කෙරෙහි බැඳීම හා විශ්වාසය පලකෙරෙන යාදින්නකට පසුව ඔහු 1948 දී එක්සත් ජනපද ජනාධිපති හැරී ට්‍රෑමන් ඊස්රායලය පිලිගෙන එයට පිටුබලය දීමේ තීරනාත්මක ක්‍රියාකලාපය ප්‍රශංසාත්මකව ගෙනහැර දැක්වීය.

අද දින ඊස්රායල් නෙසට් සභාව (පාර්ලිමේන්තුව) හමුවේ බුෂ් කථාවක් පැවැත්වීමට නියමිත අතර ඉන් පසුව සවුදි අරාබිය බලා පිටත්ව යනු ඇත. ඔහු පලස්තීන අධිකාරියේ නායක මොහමඩ් අබ්බාස් හමුවීම ප්‍රතික්ෂේප කලේය. මාර්ග ගත වාර්තාවලට අනුව නෙසට්හි අරාබි ඊස්රායල් ව්‍යවස්ථා සභිකයන් බුෂ්ගේ "මර්දනයේ, යටත්කිරීමේ හා ඊස්රායලයේ දඩබ්බර කමට" විරෝධය පෑම් වස් බුෂ්ගේ කථාව වර්ජනය කරනු ඇත.

එක්සත් ජනපද පිටුබලය ලබන විවිධාකාර ආඥාදායකයින්ගේ හා, බුෂ් පරිපාලනයේ ඉරාක ආක්‍රමනයෙන් පසු අවධියේ පුලුල් ලේ විලකට ඇද දමනු ලැබූ ජනකායකින් සැදුම් ලත් කලාපයක් තුල ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ බුෂ්ගේ යාදින්න නංවන්නේ මුලුමනින්ම බොල් හඬකි. පුලුල් ලෙස අවමානයට පාත්‍රවූ හා කුජීතවූ ජනාධිපතියෙක් ලෙස මැද පෙරදිග සංචාරය කරන බුෂ්, මුනගැසීමට නියමිතව ඇත්තේ ද එක්සත් ජනපද ගැති දේශපාලඥයන් හා එන්ට එන්ටම අස්ථාවර වෙමින් තිබෙන පාලන තන්ත්‍රයන් හොබවන ප්‍රභූන් සමූහයකි.

සිය දේශපාලන පැවැත්ම රැකගැනීම සඳහා පොරබදන බව පෙනීයන ඊස්රායල් අගමැති ඕල්මර්ට්, ආන්ඩුවේ අමාත්‍යාංශ ගනනාවකටත් ජෙරුසලමේ නාගරික ශාලාවටත් පොලිසිය කඩාවැදීම මගින් පෙන්නුම්කර ඇති බහුවිධ දූෂන පිලිබඳ පරීක්ෂනවලට මුහුනපා සිටියි. ඕල්මර්ට්ගේ මයික්‍රෆෝනය අතපසුවී දමා යෑමෙන් පසුව ඉන් බුෂ්ගේ ජාතික ආරක්ෂක උපදේශක ස්ටෙෆන් හැඩ්ලිට "කලබල නොවී ඔහොම ඉන්න, ඔහොම ඉන්න" යනුවෙන් විකාශනය වූ විට මාධ්‍ය එය නිගමනය කලේ ඔහු තමාගේ ම ආන්ඩුව ගැන එසේ කථා කල බවටය.

ඊස්රායලයේ ආරක්ෂාව පලස්තීන ජනතාව මැඩීම මගින් සහතික කර දෙන බවට වූ ඔහුගේ පොරොන්දුව ඉටුවී නැත. පලස්තීන සටන්කාමීන් විසින් අෂ්කිලෝන් නගරය වෙත විශාල ප්‍රමානයේ රොකට් ප්‍රහාරයක් එල්ල කල බව සැඳෑ සාදයට එක්වූ ඕල්මට්ට පිලිගැනීමට සිදුවිය. ඊස්රායල්-පලස්තීන "සාම ක්‍රියාවලිය" තවදුරටත් ගෙනයාම පිලිබඳ බුෂ්ගේ

කියාපෑම් ඔහුගේ ම රාජ්‍ය ලේකම්වරිය මැයි 13 වන දින "සැබෑ ප්‍රගතිය" නොසිදුවන්නක් ලෙස විස්තර කිරීමෙන් පසු හුලං බැස්සේය.

බුෂ් සංචාරය කරන ඊජිප්තුවේ ගැඹුරින්ම අපකීර්තියට පත් මිලිටරි ආඥාදායකත්වය, එසේ ම පසුගිය මාස කිහිපය තුල ආහාර මිල උද්ධමනය පිම්මේ ඉහල නැගීමට එරෙහිව හටගත් වැඩ වර්ජන හා විරෝධතාවන්ගෙන් අස්ථාවර වී ඇත. ඊජිප්තු ආන්ඩුව මෙයට ප්‍රතිචාර දැක්වූයේ අප්‍රේල් 06 වන දින මොහල්ලා අල් කොබ්රා හි ඇඟලුම් කම්කරුවන් ලක්ෂ ගනනකගේ වැඩ වර්ජනය බිඳීමට පොලිසිය යෙදවීමෙන් හා අප්‍රේල් මස නාගරික සභා මැතිවරනවල දී විරුද්ධ පක්ෂ තහනම් කිරීමෙනි.

සවුදි අරාබියේදී බුෂ් උරෙනුර ගැටෙන්නේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා කම්කරු ව්‍යාපාරය මෘග ලෙස මැඩීමෙහි යෙදීසිටින අපකීර්තිමත් මූලධර්මවාදී රාජකීය පවුල සමග ය. තෙල් මිල අඩුකිරීමට අමු තෙල් නිෂ්පාදනය ඉහල නංවන ලෙස රාජකීයයන්ගෙන් ඉල්ලා සිටීමට ද, ඉරාකය තුල එක්සත් ජනපදයේ හිරවීම හා ඉරානයට එරෙහිව එය යොදන  දේශපාලනික මෙන්ම මිලිටරි බලපෑම් උත්සන්න කිරීම පිලිබඳව සාකච්ඡා  කිරීමට ද බුෂ් බලාපොරොත්තු වෙයි. කෙසේ වුවද මෙම ඉල්ලීම් සැලකිය යුතු ප්‍රතිපල සහිතව මල්පල ගැන්වෙනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

මැයි 14 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නලයේ* කතුවැකියෙහි  "රියාද් හි අපේ මිතුරෝ" යන ශීර්ෂය යටතේ එක්සත් ජනපද-සවුදි සබඳතා මත වොෂින්ටනයේ පාලක ප්‍රභූව තුල ගොඩනැගෙමින් ඇති නොමනාපකම් පිලිබඳව ඉඟි කෙරුනි.  එක්සත් ජනපද-සවුදි සබඳතා "ක්ෂයවන බව පෙනීයයි" යනුවෙන් අවධාරනය කරමින් *ජර්නලය* සඳහන් කලේ "වැඩිවන ගෝලීය ඉල්ලුම, ඩොලරයේ පහත වැටීම, උග්‍රවන කලාපීය අවිනිශ්චිත භාවය හා නොකඩවා ඉහල නගින මිලගනන් පිලිබඳ සමපේක්ෂකයන්ගේ අනාවැකිවලින්  සැලසෙන ස්වාර්ථ සාධනය හමුවේ සවුදි අරාබියට තවදුරටත් තෙල් මිලගනන් මත පාලනයක් පවත්වාගත නොහැකිය."

සවුදි අරාබිය එක්සත් ජනපදයට මිලිටරිමය වශයෙන් සහාය දැක්වීමට හැකි තත්වයක ද නොසිටියි. *ජර්නලය* සඳහන් කල පරිදි සැබවින්ම, "පාලක සවුදි පවුලට ඇමරිකානු දේශපාලන සහයෝගය හා ආරක්ෂාව අවශ්‍යවෙයි. එසේම,  ඉරාකයෙන් සදාම් හුසේන් ඉවත්කර එහි ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ එක්සත් ජනපද මෑත උත්සාහයන් ඔප්පුකර ඇත්තේ අවශ්‍යයෙන්ම මිලිටරි නොවූවත් ඇමරිකාවේ දේශපාලන - රාජ්‍යතාන්ත්‍රික බෙලහීනත්වයයි."

වොෂින්ටනයේ එන්ට එන්ටම හුදෙකලා හා දුබල තත්වය මෑත වර්ධනයන් මගින් එලි දක්වා ඇත. බැග්ඩෑඩයේ සදර් නගරයෙහි ඇමරිකානු විරෝධී පූජක මුක්ටඩා අල් සදර්ගේ ෂියා මිලිෂියාවට එරෙහිව එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් සිදුකල ප්‍රහාරය, එක්සත් ජනපද අනුග්‍රාහකයන් හා ඉරාක ආන්ඩුව අතර ආතතීන් පිලිබිඹු කරමින් අධික ජන සංකේන්ද්‍රනයක් සහිත දුගී සියා මුඩුක්කු ප්‍රදේශයේ සංහාරය නතර කිරීමට ඉරානයේ මැදිහත්වීම ආන්ඩුව විසින් ඉල්ලා සිටි අවස්ථාවේදී, අත්හැර දැමීමට සිදුවිය.  සදර් හමුදාවන් සමඟ පැතිර යන ගැටුමක ඇඟවීම් තමාගේ ම පැවැත්මට අනතුරුදායක යයි බියට පත්වූ  බැවින් අගමැති නූරි අල් මලිකිගේ ආන්ඩුව මෙම දූත මෙහෙවරට අනුබල දුන්නේය.

මෙම සිදුවීම හෙලිදරව් කලේ බුෂ් පරිපාලනය හා එක්සත් ජනපද මිලිටරිය, ආක්‍රමනික හමුදාවන් බැග්ඩෑඩ්හි සිය ග්‍රහනය බෙහෙවින් ශක්තිමත් වී ඇතැයි කරන ඇඟවුමේ හා  ඉරාකයේ එක්සත් ජනපද පිලිවෙත අතර පැහැදිලි ප්‍රතිවිරෝධයයි. මෙය යලි වතාවක් පෙන්නුම් කරන්නේ ඉරානය විසින් ගෙනයනු ලබන කුලීකාර යුද්ධයක් තම ඉලක්කය වී ඇතැයි වොෂින්ටනයේ කියාපෑම් තිබියදීම ෂියාවරුන්ගේ අධිකාරය යටතේ එක්සත් ජනපදය විසින් අටවන ලද එම තන්ත්‍රයම ටෙහෙරානය සමඟ කිට්ටු සබඳකම් පවත්වාගෙන යන බවයි.

සදර් නගරයෙහි පවතින වෙහෙසකර සාමය පසෙකින්, එක්සත් ජනපදයේ පිටුබලය සහිත  අගමැති ෆුවාඩ් සිනියෝරාගේ ලෙබනන් ආන්ඩුවේ ප්‍රකෝපකරනයන්ට ප්‍රතිචාර වශයෙන් බේරූට්හි විශාල ප්‍රදේශයක බලය අල්ලා ගනිමින් ජනතාවාදී ෂියා පක්ෂය ලෙබනනය තුල සිය ශක්තිය පෙන්වමින් සිටියි. පසුගිය දින ගනනාවක සිදුවීම් පෙන්නුම් කරන්නේ ඉරානයේ හා සිරියාවේ පිටුබලය ලබන හෙස්බොල්ලාවරුන් එක්සත් ජනපදය විසින් මුදල් හා ආයුධ සපයමින් පවත්වාගෙන යන  ලෙබනනයේ ජාතික හමුදාවට හා සුන්නි සන්නද්ධ කන්ඩායම්වලට වඩා බෙහෙවින් බලගතු බවයි.

දෙවසරකට පෙර එක්සත් ජනපදයේ ඉල්ලීම මත ඊස්රායලය දකුනු ලෙබනනයට පහරදී රටේ විශාල ප්‍රදේශයකට එරෙහිව ගුවනින් යුද්ධයක් දියත් කලේ හෙස්බොල්ලාවරුන් තලාදැමීම අරමුනු කර ගෙනය. යුද්ධය, එක්සත් ජනපදය හා ඊස්රායලය යන දෙරට ම නින්දාවට පත්කරමින් අසාර්ථක විය.

හෙස්බොල්ලා වරුන්ගේ නවතම දේශපාලන හා මිලිටරි ශක්තිය ප්‍රදර්ශනය කිරීම බුෂ් පරිපාලනයට එරෙහි එක්සත් ජනපදයේ විදේශ ප්‍රතිපත්ති සංස්ථාපිතය ඇතුලත කටුක මත ගැටුම් අවුලුවා ලීය. මැයි 14 වන දින *නිව් යෝර්ක් ටයිම්ස්* තීරු රචක තෝමස් ෆ්‍රීඩ්මාන් විශේෂිත උන්මාදනීය ස්වරූපයකින් මෙම කොටස්වල කෝපය හා නොසතුට ප්‍රකාශයට පත් කලේය. එක්සත් ජනපද ප්‍රතිපත්තියෙන් සිදුව ඇත්තේ ඉරානයේ තත්වය

ශක්තිමත් වීම පමනක් බවට ඉන් අවලාද නැඟුනි. "ඇමරිකානු කන්ඩායම සෑම පෙරමුනකදී ම පාහේ පරාජය වෙමින් සිටියි. මැද පෙරදිගදී එක්සත් ජනපදයට මනාපයක් නොදැක්වීමත්, බිය නොවීමත් ගරු නොකිරීමත්" යනාදි වශයෙන් ඔහු තවදුරටත් ලිවීය.

ප්‍රශ්නයක් මඟහරිමින් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශක සීන් මැක්කොමැක් " සිරියාව හා ඉරානයට බලපෑම් කලහැකි අය හෙස්බොල්ලාවරුන් සමඟ ඇති එම රටවල් සතු බලපෑම යොදාගත යුතුය." *ෆිනෑන්ෂල් ටයිම්ස්* ප්‍රකාශ කලේ වොෂින්ටනය එම අර්බුදය හමුවේ කටයුතු කලේ "ඔලුව නරක්වූ නරඹන්නෙක්" විලාශයෙන් බවය.

දේශපාලන විශ්ලේෂකයෙකු වන රාමි කෞරි *ක්‍රිස්ටියන් සයන්ස් මොනිටර්* පත්‍රයට ප්‍රකාශ කලේ "බුෂ් හා රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ලෙබනනය ඔවුන්ගේ ජයග්‍රහනයේ හදාගත් දරුවා ලෙස බැහැර කලහ. එය හානි තවත් ලොකු කරයි."

බුෂ් පරිපාලනය ප්‍රතිචාර දැක්වූයේ ලෙබනන් හමුදාවට තව තවත් මූල්‍ය හා මිලිටරි ආධාර පිරිනමමිනි. එය පූර්න සිවිල් යුද්ධයක් අවුලුවාලීමට තර්ජනය කරන පියවරකි.

බුෂ් පරිපාලනයේ ද, එක්සත් ජනපද දේශපාලන හා මිලිටරි සංස්ථාපිතය ඇතුලත බලගතු කොටස් ද කලාපයෙහි එක්සත් ජනපද පසුබෑම්වලට ප්‍රතිචාර වශයෙන් ඉරාකය තුල ලේ වැගිරීම් උත්සන්න කිරීමත් ඉරානයට හෝ සිරියාවට එරෙහි මිලිටරි බලය යොදාගැනීමත් ඇතුලු මිලිටරි ප්‍රචන්ඩත්වය පුලුල් කිරීමක් සඳහා බලපෑම් කරනු ඇතැයි යන්න නිසැකය.

© www.wsws.org